සියලු හිමිකම් ඇවිරිණි / All Rights reserved

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව Provincial Department of Education NWP

# වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
# Provincial Department of Education - NWP

| 25 | S | II |
|---|---|---|

තෙවන වාර පරීක්ෂණය - 13 ශ්‍රේණිය - 2016

**Third Term Test - Grade 13 - 2016**

විභාග අංකය ............................ **ලංකා ඉතිහාසය II**

**උපදෙස්**

♦ සියලු ම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න. ඒ සඳහා එම ප්‍රශ්න සමඟ වෙන්කර ඇති ඉඩ යොදන්න.

1. **ඔබට සපයා ඇති සිතියමේ පහත සඳහන් සියලුම ස්ථාන ලකුණු කොට නම් කරන්න. ඒවායින් කැමති දෙකක් පිළිබඳව කෙටි ඓතිහාසික සටහන් ලියන්න.**

| | |
|---|---|
| (i) කලාවැව | (v) දඹකොළ පටුන |
| (ii) කිරිඳි ඔය | (vi) ත්‍රිකුණාමලය |
| (iii) මිහින්තලේ | (vii) මහනුවර |
| (iv) මල්වාන | (viii) මීගමුව |

(නිවැරදිව ලකුණු කොටනම් කිරීමට ලකුණු 01 බැගිනි කෙටි ඓතිහාසික සටහනකට ලකුණු 05 බැගිනි)

2. පහත දැක්වෙන අංශ කෙරෙහි අවධානය යොමු කරමින් ක්‍රි.ව.හතරවන සියවස දක්වා ශ්‍රී ලංකාවේ ඉතිහාසය හැදෑරීම සඳහා මහාවංසයෙහි ඇති වැදගත්කම සාකච්ඡා කරන්න.
   - (i) මහාවංසය රචනා කිරීමට පාදක වූ මූලාශ්‍ර
   - (ii) මහාවංසය හා අභිලේඛනගත තොරතුරු සැසඳෙන අවස්ථා
   - (iii) බුදු සසුනේ වර්ධනය (ලකුණු 14)

3. අනුරාධපුර යුගයේ ශ්‍රී ලංකාවේ විදේශීය වෙළඳාම පිළිබඳව පහත සඳහන් මාතෘකා යටතේ විවරණයක් කරන්න.
   - (i) ශ්‍රී ලංකාවේ විදේශ වෙළඳාමට සම්බන්ධ වූ රටවල් තුනක් නම් කරන්න (ලකුණු 03)
   - (ii) විදේශ වෙළඳාම සඳහා භාවිතා කළ ශ්‍රී ලංකාවේ වරාය තුනක් නම් කරන්න (ලකුණු 03)
   - (iii) පුරාතන ශ්‍රී ලාංකිකයෝ වෙළඳාමට කුසීත වූහ. මේ ප්‍රකාශය විස්තරාත්මකව විමසන්න . (ලකුණු 08)

4. ශ්‍රී ලංකාවේ දේශපාලන එක්සත්භාවයක් ඇති කළ බැවින් පළමුවන විජයබාහු හා පළමුවන පරාක්‍රමබාහු යන රජවරු දෙදෙනාම නිසැකවම මෙරට ඉතිහාසයේ ශ්‍රේෂ්ඨ පාලකයෝ වෙති.

(i) පළමුවන විජයබාහු රජු බාලකාලයේ පටන් රැක බලාගෙන ඔහුට ආධාර දුන් ප්‍රදේශාධිපතියා නම් කරන්න (ලකුණු 01)

(ii) පළමුවන පරාක්‍රමබාහු රජතුමාගේ පියා සහ මව නම් කරන්න (ලකුණු 02)

(iii) ස්වකීය දේශපාලන කටයුතුවලදී පළමුවන විජයබාහු රජතුමා සහ පළමුවන පරාක්‍රමබාහු රජතුමා මුහුණ දුන් අභියෝග සැකෙවින් දක්වන්න. (ලකුණු 04)

(iv) මෙම පාලකයන් තමන් මුහුණ දුන් අභියෝග ජයගත් ආකාරය සංසන්දනය කරමින් ඉහත දැක්වෙන ප්‍රකාශය සාකච්ඡා කරන්න (ලකුණු 07)

5. පහත සඳහන් මාතෘකා අතුරෙන් ඕනෑම දෙකක ඓතිහාසික වැදගත්කම පිළිබඳව කෙටි සටහන් ලියන්න.

(i) වසභ රජතුමාගේ වාරි කටයුතු

(ii) දෙවන පරාක්‍රමබාහු රජතුමාගේ රාජ්‍ය සමයේ ඇති වූ සංස්කෘතික වර්ධනය

(iii) ආර්යචක්‍රවර්ති පාලකයෝ

(iv) කෝට්ටේ යුගයේ සාහිත්‍යය

(v) පළමුවන රාජසිංහ රජතුමාගේ දේශපාලන කාර්ය සංසිද්ධිය

(එක් කොටසකට ලකුණු 07 බැගිනි)

6. එක්කෝ (A) කොටසට නැතහොත් (B) කොටසට පමණක් පිළිතුරු සපයන්න

(A) පෘතුගීසීන් ශ්‍රී ලංකාවේ මුහුදු බඩ ප්‍රදේශවල අනුගමනය කළ ආගමික ප්‍රතිපත්තියේ ප්‍රධාන අරමුණු සහ සිය ආගම පතුරුවා හැරීම සඳහා ඔවුන් විසින් යොදා ගනු ලැබූ ක්‍රියාමාර්ග පරීක්ෂා කරන්න (ලකුණු 14)

(B) ශ්‍රී ලංකාවේ මුහුදුබඩ ප්‍රදේශවල ලන්දේසීන් විසින් අනුගමනය කරන ලද ආර්ථික ප්‍රතිපත්තියේ ප්‍රධාන පක්ෂණ පරීක්ෂා කරන්න. (ලකුණු 14)

7. ශ්‍රී ලංකාවේ අධ්‍යාපන ක්‍රමයේ සිදුවූ සුවිශේෂ වෙනස් කම් 1833 කෝල්බෲක් කැමරන් ආණ්ඩුක්‍රම ප්‍රතිසංස්කරණයේ සිට 1931 ඩොනමෝර් ආණ්ඩුක්‍රම ප්‍රතිසංස්කරණයේ අවසානය දක්වා කාලය පිළිබඳව අවධානය යොමු කරමින් පැහැදිලි කරන්න. (ලකුණු 14)

8. පහත සඳහන් මාතෘකා අතරින් ඕනෑම මාතෘකා 02 ක් තෝරාගෙන ඓතිහාසික වැදගත්කම පිළිබඳව විස්තර කරන්න.

1. 1818 බ්‍රිතාන්‍ය විරෝධී අරගලය
2. 1978 විධායක ජනාධිපති ධූරය
3. 19 සියවස අවසාන භාගයේදී සිදුවූ ආගමික පුනරුදය
4. සෝල්බරි ආණ්ඩුක්‍රමය හා ජාතික නිදහස (ලකුණු 14)

9. නිදහසින් පසුව ශ්‍රී ලංකාවේ අධ්‍යාපන ක්‍රමයේ ඇති වූ වෙනස්කම් පිළිබඳව විමසීමක් කරන්න. (ලකුණු 14)

